බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
සංස්කෘතික අංශය கலாசார பிரிவு Cultural Division

8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව 8 ஆம் மாடி, செத்சிறிபாய பத்தரமுல்லை, ஸ்ரீ லங்கா
8th Floor, Sethsiripaya, Battaramulla, Sri Lanka

මගේ අංකය / எனது இல / My No. } සිඒ/6/4/2/7/2024   ඔබේ අංකය / உமது இல / Your No. }   දිනය / திகதி / Date. } 2024.07. 04

---

පූජ්‍ය පක්ෂය
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
සංස්ථා / මණ්ඩල ප්‍රධානීන්
විදුහල්පතිවරුන්

## ආබාධ සහිත පුද්ගලයන්ගේ සාහිත්‍ය හා කලා නිර්මාණ තරගාවලිය - 2024

ආබාධ සහිත පුද්ගලයන්ගේ නිර්මාණ හැකියාව ඇගැයීම සහ එම නිර්මාණ එළි දැක්වීමේ අවස්ථාව උදාකිරීමේ අරමුණෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ආබාධ සහිත පුද්ගලයන්ගේ සංස්කෘතික අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ කාර්යාංශය මඟින් සාහිත්‍ය හා කලා නිර්මාණ තරගාවලිය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

**01.** <u>තරඟ අංශ</u>

1.1 කෙටි කතා
1.2 ආබාධිත පුද්ගල චරිතාපදාන
1.3 ගීත රචනා
1.4 පද්‍ය රචනා
1.5 චිත්‍ර නිර්මාණ
1.6 ඡායාරූප

**02.** <u>පොදු කොන්දේසි</u>

2.1 අයදුම්පත්‍රයේ හැර නිර්මාණයෙහි තරඟකරුවන්ගේ නම හෝ ආයතනය පිළිබඳ හෝ කිසිදු සඳහනක් අන්තර්ගත නොකළ යුතු වේ .කිසියම් හෙයකින් එසේ යම් සඳහනක් අදාළ කෙටි කතාව, ආබාධිත පුද්ගල චරිතාපදාන, ගීත රචනා, පද්‍ය රචනා ,ඡායාරූපය හා චිත්‍රයෙහි අන්තර්ගත වී නම් එම නිර්මාණය ප්‍රතික්ෂේප කරනු ලැබේ,

2.2 යොමු කරන නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර පරිවර්තන හෝ අනුවර්තන නොවිය යුතුය.

2.3 කිසියම් ජාතියකට, ආගමකට සහ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිතයට අපහාස වන පරිද්දෙන් හෝ යම් පුද්ගලයකු හෝ පිරිසක් පීඩාවට හෝ අපහසුතාවයට පත් කරන හෝ රජය හෝ රජයේ ප්‍රතිපත්ති විවේචනය කෙරෙන පරිදි නිර්මාණයක් ඉදිරිපත් නොකළ යුතු අතර, එවැනි නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. ජාතික සමඟිය හෝ ආගමික සහජීවනයට බාධා වන කිසිදු නිර්මාණයක් බාර ගනු නොලැබේ. යම් හෙයකින් මෙවැනි නිර්මාණයක් තරගය සඳහා ඉදිරිපත් කිරීමෙන් යම් ගැටලුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කිසිදු වගකීමට නොබැඳෙන අතර, එහි සම්පූර්ණ වගකීම අදාළ නිර්මාණකරු සතුවේ.

---

දුරකථන අංකය / தொலைபேசி இல / Telephone No.
අමාත්‍ය / அமைச்சர் / Minister } 011-2861147
ෆැක්ස් / தொலைநகல் / Fax. } 011-2861107
ලේකම් / செயலாளர் / Secretary } 011-2861108
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2872004
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail. } culturalsecoffice@gmail.com
කාර්යාලය / அலுவலகம் / Office } 011-2872001, 011-2876586, 011-2872023
ෆැක්ස් / தொலைநகல் / Fax. } 011-2872024
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail. } culturalmin@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site. } www.cultural.gov.lk

2.4 තරගකරුගේ ආබාධිත ස්වභාවය පිළිබඳව විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානියාගේ/ වෛද්‍යවරයකුගේ/ ග්‍රාමනිලධාරිවරයාගේ/ සංස්කෘතික නිලධාරිගේ/ සමාජසේවා නිලධාරිගේ/ සාමවිනිසුරුවරයකුගේ/ දිවුරුම් කොමසාරිස්වරයකුගේ නිල මුද්‍රාව සහ අත්සන සහිතව අයදුම්පත්‍රය නිර්දේශය කර නිර්මාණය සමග ඉදිරිපත් කල යුතුවේ

2.5 කෙටි කතා, ආබාධිත පුද්ගල් චරිතාපදාන, ගීත රචනා, පද්‍ය රචනා යන තරග අංශයන් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් වෙන වෙනම පැවැත්වේ.

2.6 ප්‍රමාද වී ලැබෙන සහ තරග කොන්දේසිවලට පටහැනි නිර්මාණ පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.7 සෑම නිර්මාණයක් සමඟම වෙන වෙනම ඉල්ලුම් පත්‍රය බැගින් අමුණා එවිය යුතු අතර, එක් තරග අංශයකින් උපරිම නිර්මාණ තුනක් බාරගනු ලැබේ.

2.8 ආබාධ සහිත පුද්ගලයන්ගේ සාහිත්‍ය හා කලා නිර්මාණ තරගාවලිය පිළිබඳ සියලුම ප්‍රතිපත්තිමය තීරණ හා අවසාන වගකීම සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතුවේ.

03. <u>නිර්මාණ ඉදිරිපත් කිරීම</u>

3.1 මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානියාගේ/ වෛද්‍යවරයකුගේ/ ග්‍රාම නිලධාරිවරයකුගේ/ සංස්කෘතික නිලධාරියකුගේ/ සමාජ සේවා නිලධාරියකුගේ/ සාම විනිසුරුවරයකුගේ/ දිවුරුම් කොමසාරිස්වරයකුගේ නිර්දේශ සමඟ නිර්මාණය ඉදිරිපත් කළ යුතුය. එසේ නිර්දේශය, නිල මුද්‍රාව හා අත්සන රහිත නිර්මාණ බාර ගනු නොලැබේ.

3.2 ඉදිරිපත් කරනු ලබන සියලුම නිර්මාණ ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, 08 වන මහළ, සෙත්සිරිපාය I අදියර, බත්තරමුල්ල යන ලිපිනයට 2024.08.30 දිනට පෙර තැපැල් මාර්ගයෙන් එවීමට හෝ අතින් ගෙනවිත් අමාත්‍යාංශයේ ආබාධ සහිත තැනැත්තන්ගේ සංස්කෘතික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ කාර්යංශය වෙත බාර දීමට කටයුතු කළ යුතු අතර ලියුම් කවරයේ වම් පස කෙළවර ආබාධ සහිත පුද්ගලයන්ගේ සාහිත්‍ය හා කලා නිර්මාණ තරගාවලිය **"(තරග අංශය හා කාණ්ඩය - පාසල්/ විවෘත) "** යනුවෙන් සඳහන් කළ යුතුය

04. <u>තරඟ විනිශ්චය</u>

4.1 ප්‍රවීණ විද්වත් විනිශ්චය මණ්ඩලයක් විසින් නිර්මාණ විනිශ්චය කරනු ලබන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

4.2 නියමිත ප්‍රමිතියට අනුකූල නිර්මාණ මෙම තරගය සඳහා නොලැබුණ හොත් මෙම තරගයට නියමිත ත්‍යාග, සහතික හෝ සම්මාන නම් නොකර සිටීමට විනිශ්චය මණ්ඩලයට පූර්ණ අයිතිය හිමිවේ.

4.3 තරඟ කොන්දේසිවලට පටහැනි අයුරින් නිර්මාණයක් ඉදිරිපත් කර ඇති බව සනාථ වුවහොත් සම්මාන ලබා දීමෙන් පසුවද එම ජයග්‍රහණ අවලංගු කර සම්මාන නැවත කැඳවීමට කටයුතු කෙරේ .තරග කොන්දේසි කඩකරන නිර්මාණකරුවන් අසාදු ලේඛනගත කිරීමට (Black List) කටයුතු කරනු ලැබේ.

<u>05.සාහිත්‍ය තරඟාවලිය</u>

<u>.5.1තරග කොන්දේසි</u>

5.1.1 ගීත රචනා, ආබාධිත පුද්ගල චරිතාපදාන, පද්‍ය රචනා ,කෙටිකතා A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්තේ පරිගණක ගත කර හෝ පැහැදිලි අත් අකුරෙන් හෝ බ්‍රේල් ක්‍රමයට තිබිය යුතුය . පරිගණකගත කරන නිර්මාණ ඉස්කෝලපොත අක්ෂරයේ, ඒකක 12 ප්‍රමාණයෙන් විය යුතු ය.

5.1.2 ජයග්‍රාහී නිර්මාණවල පූර්ණ අයිතිය නිර්මාණ ශිල්පියා සතු වන අතර, ඒවායේ ප්‍රචාරණ අයිතිය සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතුවේ.

<u>සාහිත්‍යය</u>

- <u>කෙටිකතා</u>
  - පාසල්: උපරිම වචන 3000 කට යටත් විය යුතුය.
  - විවෘත: උපරිම වචන 5000 කට යටත් විය යුතුය.
- <u>ආබාධිත පුද්ගල චරිතාපදාන තරගය (ස්වයං ලිඛිත චරිත කතා / නිදහස් ආත්ම භාෂණ)</u>

ආබාධ සහිත පුද්ගලයන්ට තමන් පිළිබඳව ලෝකයට ප්‍රකාශ කිරීමට ඇති දේ, නිර්මාණාත්මකව සංනිවේදනය කිරීමේ අවස්ථාව මෙමගින් උදාවේ. තමන් මුහුණ දුන්/දෙන දුෂ්කරතා, අභියෝග, තම අවශ්‍යතා, අයිතිවාසිකම්, ජීවිතය, සංස්කෘතිය, සිතුම්, පැතුම්, දෛනික කාර්යයන්, ආදී වශයෙන් අභිමත ඕනෑම කරුණු පිළිබඳ අවධානය යොමු කරමින්, තමා පිලිබඳව තමන් විසින්ම රචනා කළ නිර්මාණාත්මක ලේඛන මෙම තරගයට ඉදිරිපත් කළ හැකිය.

- පාසල්: උපරිම වශයෙන් වචන 5000කට වඩා වැඩි නොවිය යුතුය.
- විවෘත: උපරිම වශයෙන් වචන 10,000කට වඩා වැඩි නොවිය යුතුය.

- <u>ගීත රචනා</u>
  - මිනිත්තු 3- 3 1/2 අතර ගැයෙන ගීතයකට යෝග්‍ය ගේය පද මාලාවක් විය යුතු ය.
  - පාසල් හා විවෘත අංශය යන දෙඅංශයෙන්ම පැවැත්වේ
- <u>පද්‍ය රචනා</u>
  - සඳැස් පද්‍ය රචනාවකදී පද්‍ය රචනය තුළ අඩංගු කාව්‍ය කොටස් උපරිම ලෙස දහයකට සීමා විය යුතු ය.

- නිසදැස් පද්‍ය රචනාවකදී උපරිම A4 ප්‍රමාණයේ කඩදාසි පිටු දෙකකට සීමා විය යුතුය.
- පාසල් හා විවෘත අංශය යන දෙඅංශයෙන්ම පැවැත්වේ

ඉහත තරග සඳහා ඕනෑම තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.

**5.1** <u>සාහිත්‍ය තරඟ සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| කෙටි කතා<br>ආබාධිත පුද්ගල චරිතාපදාන<br>ගීත රචනා<br>පද්‍ය රචනා | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

**6** <u>චිත්‍ර නිර්මාණ</u>

6.1 <u>තරග කොන්දේසි</u>

6.1.1 චිත්‍ර ඇඳීම සඳහා තමා කැමති මාධ්‍යයක් භාවිතා කරමින් ඊට සුදුසු පෘෂ්ඨයක ( කඩදාසි/ බෝඩ්/ කැන්වස්) චිත්‍රණය කළ හැකි ය.
6.1.2 චිත්‍රය ප්‍රමාණය 18" X 14" (අඟල්) විය යුතුය.

**6.1** <u>චිත්‍ර තරගය සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| අනු අංකය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| චිත්‍ර | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

**7** <u>ඡායාරූප</u>

7.1 <u>තරග කොන්දේසි</u>

7.1.1 මෙසේ ඉදිරිපත් කරනු ලබන ඡායාරූප සංස්කරණය කළ නොහැකි අතර, ඒවායේ ස්වභාවික පෙනුමට හානි නොවන ලෙස දිග, පළල හා ආලෝක තීව්‍රතාව සකස් කළ හැකිය.

7.1.2 එක් තරගකරුවකුට තරගය සඳහා ඉදිරිපත් කළ හැකි උපරිම ඡායාරූප ප්‍රමාණය 03 කි.

7.1.3 වර්ණ ඡායාරූප හෝ කළුසුදු ඡායාරූප ඉදිරිපත් කළ හැකිය.

7.1.4 කෘතියේ අන්තර්ගතයට අදාළ නොවන බාහිර සලකුණු කිසිවක් එනම්, දිය සලකුණු, නම්, දින සලකුණු හා ලාංඡන ආදිය ඡායාරූපයේ අඩංගු වේ නම් එම ඡායාරූප තරගයෙන් ඉවත් කරනු ලැබේ.

7.1.5 සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ඕනෑම මොහොතක තරගය සඳහා ඉදිරිපත් කරන ඡායාරූපවල සංස්කරණය නොකර ලද මුල් ගොනුව ( RAW හෝ JPEG) ලෙස ඉදිරිපත් කිරීමට ඡායාරූප ශිල්පියා බැඳී සිටිය යුතුය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහ ප්‍රමාද වන ඡායාරූප තරගයෙන් ඉවත් කිරීමට හෝ ජයග්‍රාහණය ලබා නොදීමට විනිශ්චය මණ්ඩලය තීරණය කරනු ඇත.

7.1.6 තරගයට ඉදිරිපත් කරන සියලුම ඡායාරූප අදාළ ශිල්පියා විසින්ම ලබා ගන්නා ලද ඡායාරූප විය යුතුය. එහි බුද්ධිමය දේපළ අයිතිය සහ නිරූපණ හිමිකම පිළිබඳ නෛතික ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කිසි ලෙසකින් වගකීමට බැඳී නොසිටිනු ඇත.

7.1.7 එසේම එම ඡායාරූප මීට පෙර කිසිදු තරගයක් වෙනුවෙන් හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ ඉදිරිපත් නොකළ ඡායාරූප විය යුතුය.

### 7.2 ඡායාරූප තරගය සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන

| අනු අංකය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| ඡායාරූප | ප්‍රථම ස්ථානය | 20,000.00 |
| | දෙවන ස්ථානය | 15,000.00 |
| | තෙවන ස්ථානය | 10,000.00 |
| | කුසලතා ස්ථාන 05 ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයකුට 5000.00 බැගින් |

වැඩිදුර තොරතුරු www.cultural.gov.lk වෙබ් අඩවියෙන් සහ සංස්කෘතික අයිතිවාසිකම් ප්‍රවර්ධන කාර්යංශයේ දුරකතන අංකය 0112876586 ඉනෝකා බෝගොඩ 0711354361 අමතා විමසා ලබා ගත හැකිය.

තිලක් නන්දන හෙට්ටිආරච්චි
අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)

අත්.කළේ - එච්.එම්.බී.හේරත්
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දුක. - 011 2876586
ෆැක්ස් - 011 2879088
ඊමේල් - cultural.dis@gmail.com

බුද්ධශාසන ,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ආබාධ සහිත පුද්ගලයන්ගේ සාහිත්‍ය හා කලා නිර්මාණ තරගාවලිය - 2024

අ .නිර්මාණකරුගේ පෞද්ගලික තොරතුරු (සෑම අයදුම්කරුවෙකුම මෙම කොටස පිරවිය යුතුය) -

1. සම්පූර්ණ නම -..............................................................................................
2. සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින්:.............................................................................
3. පෞද්ගලික ලිපිනය -......................................................................................
4. ආබාධිත ස්වභාවය:-.......................................................................................
5. දුරකතන අංකය -...........................................................................................
6. ග්‍රාමසේවා වසම - ..........................................................................................
7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - .......................................................................
8. දිස්ත්‍රික්කය .. -...............................................................................................

ආ නිර්මාණකරුගේ ආයතනික ./ පාසල් තොරතුරු

9. ආයතනය/ පාසල ..............................................................................................
10. ආයතනය / පාසල අයත් පළාත -...........................................................................
11. තරග කාණ්ඩය (පාසල්/ විවෘත) - ........................................................................
12. කාර්යාලීය දුරකතන අංකය ...............................................................................

ඇ - නිර්මාණ පිළිබඳ තොරතුරු .

☐ කෙටි කතා ☐ ගීත රචනා ☐ පද්‍ය රචනා

☐ අබාධිත පුද්ගල චරිතාපදාන ☐ චිත්‍ර නිර්මාණ ☐ ඡායාරූප

නිර්මාණයේ නම ..................................................................... -.......................................................................

ඉහත නම් සඳහන් කෙටි කතා ,ආබාධිත පුද්ගල චරිතාපදාන, ගීත රචනා ,පද්‍ය රචනා ,චිත්‍ර නිර්මාණ හා ඡායාරූප ස්වතන්ත්‍ර නිර්මාණ වන බවත් ,මෙම තරගාවලියේ තරග කොන්දේසි ම විසින් පිළිපදින බවත් , එම කොන්දේසි හා එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

නම ........................................................ - අත්සන ......................................................

පූජ්‍යවරුන් / ආයතන ප්‍රධානි / විදුහල්පති/ ග්‍රාමනිලධාරී/ සංස්කෘතික නිලධාරී / සමාජසේවා නිලධාරී/ සාම විනිසුරු/ දිවුරුම් කොමසාරිස්ගේ නිර්දේශය -

මෙම ආයතනයේ සේවය කරන / විදුහලේ අධ්‍යාපනය ලබන / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / ග්‍රාමසේවක වසමේ පදිංචි/ ..................................................... .......................................................................

...................................................................................................................................

මයා ශිෂ්‍යාව/ ශිෂ්‍යයා/ මයා/ මිය/මෙන ආබාධ සහිත අයෙකු බවත්, ඉදිරිපත් කර ඇති නිර්මාණය ඔහුගේ / ඇයගේම බව සහතික කරමි.

දිනය ............... - ආයතන ප්‍රධානියාගේ අත්සන .......................................නිල මුද්‍රාව